# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1831/30 - 2013 ඔක්තෝබර් මස 11 වැනි සිකුරාදා - 2013.10.11

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ, ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013.11.01 වැනි දින සිට  විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 ඔක්තෝබර් මස 03 දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

*උපලේඛනය*

ඉංජිනේරු  කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1945  අගෝස්තු මස 10 වැනි දින අංක 9447 දරන  *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට 2010 ජුනි මස 30 දින අංක 1660/35 දරන  *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයේ  වෙනස් කරන ලද්දා වූ, තීරණ එම උපලේඛනයේ සඳහා පහත  I කොටස ඇතුළත් කිරීමෙන්ද, II කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස් ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතුය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*I වන කොටස*

**සේවකයින්ගේ පන්තිය**

***නුපුහුණු කම්කරුවෝ***

| | |
|---|---|
| සිවිල් ඉංජිනේරු<br>යාන්ත්‍රික ඉංජිනේරු<br>ගුවන් විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු | පුහුණුවක් අවශ්‍ය නොවන කම්කරුවන් |

**අර්ධ පුහුණු කම්කරුවෝ**

*සිවිල් ඉංජිනේරු* : පින්තාරුකාරයෝ, අයින් කානු කැපීම, පාර මතුපිට සිටීම, කළුගල් ඇතිරීම, පැටවීම, බැම සහ කළුගල් ගොඩගැසීම, පාරට තාර දැමීම සහ අතින් කොන්ක්‍රීට් ඇනීම යන වැඩවල යෙදී සිටින කම්කරුවන් ද ඇතුළත්ව මාර්ග අළුත්වැඩියා කිරීමෙහි, තැනීමෙහි සහ පවත්වාගෙන යෑමෙහි යෙදී සිටින මේසන් අත් උදව්කරුවෝ සහ කම්හල්කරු අත් උදව්කරුවෝ.

*යාන්ත්‍රික ඉංජිනේරු:* කුළුගෙඩිකාරයින් සහ මිටියෙන් තලන්නෝ, පැට්ලර්වරු, (යකඩ හා පිත්තල ), උණු කරන්නෝ, (යකඩ හා පිත්තල ) පරීක්ෂකයෝ, (දැව ) ඉරන්නෝ, කෝර්කාරයෝ, (ලී) බොයිලේර්වරු සේවකයෝ, ඩ්‍රයිවර්වරු, (ඇන්ජින් ) ෆයර්මන්වරු, ටයර් රෙපෙයාර් කරන්නෝ, ටයර් වෝල්කනයිසින් කරන්නෝ, පින්තාරුකාරයෝ, ඇතිකාරයෝ, ග්‍රීස් ගසන්නෝ, සුද්ධ කරන්නෝ සහ සෝදන්නෝ .

*විදුලි ඉංජිනේරු :* වයර්මන්වරු, විදුලිරංජකයෝ

*ගුවන්විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු* : එකලස්කරන්නෝ, බැටරි කේස් සාදන්නෝ (ගුවන් විදුලි), පාස්සන්නෝ, සවිකරන්නෝ, සීල් කරන්නෝ, කැබිනට් පිරිසිදු කරන්නෝ, කටර්ස් (වැසි) නමන්නෝ, පින්තාරු කරන්නන්, (බෝඩ්), ඩයල්ස් බැප් යනාදිය පරීක්ෂකයන්, පවර්ප්‍රෙස්, ඔපරේටර්වරු, අසුරන්නන්, ඇනෝඩයිසර්වරු, සෙට්ටෙස්වරු, එවර්වරු, බැෆ්න් මැෂින් ඔපරේටර්වරු, සැන්ඩින් මැෂින් ඔපරේටර්වරු.

***පුහුණු කම්කරුවෝ :***

*සිවිල් ඉංජිනේරු* : ඊයම් වැඩකාරයෝ, කම්හල්කාරයෝ, සළකුණු අඳින්නෝ, පොලිෂ් කරන්නෝ (ප්‍රංශ පොලිෂ් ගාන්නෝ ), පෙදරේරුවෝ, තෙල් හා වාෂ්ප රෝල් පදවන්නෝ, ෂිප්රයිටර්වරු, බෝඩ් සාදන්නෝ, හුඩ් සාදන්නෝ, පතල්කරුවෝ, පුපුරවන්නෝ, විදුම්කරුවෝ, කුළුගෙඩිකරුවෝ.

*යාන්ත්‍රික ඉංජිනේරු* : පට්ටල්කාරයෝ, යන්ත්‍ර ශිල්පීහු (යකඩ හා වානේ වැඩ ), යන්ත්‍ර ශිල්පීහු (ලීබඩු ), තඹ වැඩකාරයෝ, වැද්දුම්කාරයෝ, බොයිලේරු තනන්නෝ, වැල්ඩිංකාරයින් හා දවන්නෝ, විදුලි මීටි ක්‍රියාකරවන්නෝ, ලිස්තරකාරයෝ (යකඩ හා පිත්තල), පුරුද්දන්නෝ, තවුකාරයෝ, මෝස්තර හදන්නෝ, වඩුවෝ, කැබිනට් සාදන්නෝ, බෝට්ටු සාදන්නෝ, කියත් මුවහත් තියන්නෝ, මැෂින් පිහි මුවත් තියන්නෝ, ලාන්ච් තංඩෙල්ලා ඩ්‍රයිවර්වරු, පාහන්නෝ, ලනු හා රුවල් හදන්නෝ, විදුරු සවිකරන්නෝ, ඩ්‍රයිවර්වරු, මිකැනික්වරු, බෙලෙක් වැඩ කාරයෝ (මෝටර්), ටින්ස්මිත්ලා, රිවෙට්කාරයෝ , සහ කෝර්කාරයෝ දොඹකර ක්‍රියාකරවන්නෝ.

*විදුලි ඉංජිනේරු* : කාර්මිකයෝ (ගුවන්විදුලි), ට්‍රාන්ස්ෆෝමර් සාදන්නෝ, කොයිල්ඔතන්නෝ, ඩයිකාස්ටර්ස්, රේඩියෝ මිකැනික්වරු, පොලිෂ් කරන්නෝ (රේඩියෝ කැබිනට් සහ අනෙක් කොටස් ), ට්‍රාන්ස්ෆෝමර් වයින්ඩර්ස් සහ එකලස් කරන්නෝ, ටියුනර් එලයින්නර්වරු.

***කාවල්කාරයෝ*** :

| | |
|---|---|
| සිවිල් ඉංජිනේරු<br>යාන්ත්‍රික ඉංජිනේරු,<br>විදුලි ඉංජිනේරු<br>ගුවන් විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු | සියලුම ශ්‍රේණිවල යෙදී සිටින කාවල්කාරයෝ |

*වෘත්තීය හදාරන්නෝ සහ ආධුනිකයෝ* :

සිවිල් ඉංජිනේරු
යාන්ත්‍රික ඉංජිනේරු,
විදුලි ඉංජිනේරු
ගුවන් විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු
} පුහුණු හා අර්ධ පුහුණු සඳහා පුහුණුවීමේ කාල සීමාව අවු. 04 කි.

මෙම උපලේඛනයේ සඳහන් "අවුරුද්ද" යන වචනයෙන් කවර නම් හෝ වෘත්තීය හදාරන්නෙකු හෝ ආධුනිකයකු සම්බන්ධයෙන් අදහස් වෙන්නේ දවස් 365 ක් අවිච්ඡින්නව ස්වාකාර්යයෙහි ඔහු යෙදී සිටි බවයි. එමෙන්ම, පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක න්‍යායික පුහුණුවෙන් පසුව ඇති ප්‍රායෝගික පුහුණුව සඳහා යොදවන්නන් මෙයින් අදහස් කෙරේ.

*II වන කොටස*

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| සේවා වර්ෂය | නුපුහුණු<br>රු. ශ. | අර්ධ පුහුණු<br>රු. ශ. | පුහුණු<br>රු. ශ. | මුරකරුවන්<br>රු. ශ. | වෘත්තීය හදාරන්නන් හා ආධුනිකයින්<br>රු. ශ. |
|---|---|---|---|---|---|
| 1 වසර | 12,500 00 | 12,800 00 | 13,100 00 | 12,500 00 | 7,500 00 |
| 2 වසර | 12,600 00 | 12,925 00 | 13,250 00 | 12,600 00 | 7,650 00 |
| 3 වසර | 12,700 00 | 13,050 00 | 13,400 00 | 12,700 00 | 7,800 00 |
| 4 වසර | 12,800 00 | 13,175 00 | 13,550 00 | 12,800 00 | 7,950 00 |
| 5 වසර | 12,900 00 | 13,300 00 | 13,700 00 | 12,900 00 | |
| 6 වසර | 13,000 00 | 13,425 00 | 13,850 00 | 13,000 00 | |
| 7 වසර | 13,100 00 | 13,550 00 | 14,000 00 | 13,100 00 | |
| 8 වසර | 13,200 00 | 13,675 00 | 14,150 00 | 13,200 00 | |
| 9 වසර | 13,300 00 | 13,800 00 | 14,300 00 | 13,300 00 | |
| 10 වසර | 13,400 00 | 13,925 00 | 14,450 00 | 13,400 00 | |
| 11 වසර | 13,500 00 | 14,050 00 | 14,600 00 | 13,500 00 | |
| 12 වසර | 13,600 00 | 14,175 00 | 14,750 00 | 13,600 00 | |
| 13 වසර | 13,700 00 | 14,300 00 | 14,900 00 | 13,700 00 | |
| 14 වසර | 13.800 00 | 14,425 00 | 15,050 00 | 13,800 00 | |
| 15 වසර | 13,900 00 | 14,550 00 | 15,200 00 | 13,900 00 | |
| 16 වසර | 14,000 00 | 14,675 00 | 15,350 00 | 14,000 00 | |
| 17 වසර | 14,100 00 | 14,800 00 | 15,500 00 | 14,100 00 | |
| 18 වසර | 14,200 00 | 14,925 00 | 15,650 00 | 14,200 00 | |

*IV වන කොටස*

**සතියේ නිවාඩු දිනය (24 වගන්තිය)**

මෙම කොටසේ 2(ආ) වගන්තියෙන් පසුව පහත සඳහන් ඡේදය ඇතුළත් විය යුතු වන්නේය.

"එවැනි සති නිවාඩු දිනක පඩිපාලක සභා ආඥාපනතේ 25 වගන්තියේ සඳහන් ප්‍රතිපාදන පරිදි නියම කරනු ලැබූ ප්‍රසිද්ධ නිවාඩු දිනයක් යෙදුනහොත් එම ප්‍රසිද්ධ නිවාඩු දිනය නියමිත දිනට ලබා දී අහිමි වන සති නිවාඩු දිනය වෙනුවට වෙනත් දිනයක් ඊළඟ සති නිවාඩුව එළඹීමට ප්‍රථම දවස් 06 ඇතුළත ලබා දිය යුතුවේ."

10 - 837

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.